**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2019**

---

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවීම් වවුචර්වල, අදාළ වටිනාකම හා කාර්යභාරය තහවුරු කරන බිල්පත්, රිසිට්පත්, තොග සහතික ආදි ලියවිලි ගෙවීම තහවුරු කිරීමට සාක්ෂි ලෙසට වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී ගෙවන ලද එකතුව රු1,386,630 ක ගෙවීම් වවුචර්වලට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. | බිල්පත් අතපසුවීමතික් අස්ථානගත වීමක් සිදුව ඇත. ඉදිරියේදී මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. | ගෙවීම් වවුචර් සමඟ ඊට අදාළ තහවුරු කිරීමේ මූලාශ්‍ර ලේඛන ඉදිරිපත් කළ යුතු බව. |

**2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| i. | මුදල් රෙගුලාසි 137 | රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් අනුමත නොකර වවුචර් 162 කින් රු.17,191,909 ක් ගෙවා තිබුණි. | ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බව පිළිගන්නා අතර, භාරකාර මණ්ඩල රැස්වීම්වලදී ඒ ඒ කාල පරිච්ඡේදයන් තුළ කරන ලද සියලු වියදම් අනුමත කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් අනුමත කළ යුතු බව. |
| ii. | මුදල් රෙගුලාසි 138 හා 257 | සහතික කළ වවුචර් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී වවුචර් 171 ක් සහතික නොකර රු.17,845,862 ක ගෙවීම් කර තිබුණි. | ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බව පිළිගන්නා අතර, භාරකාර මණ්ඩල රැස්වීම්වලදී ඒ ඒ කාලපරිච්ඡේදයන් තුළ කරන ලද සියලු වියදම් අනුමත කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| iii. | මුදල් රෙගුලාසි 139 | වවුචරයේ සඳහන් දළ මුදල විධිමත් පරිදි ගෙවන ලද බවට හා එම ගෙවීම් කළ බවට "ගෙවන ලදී" යන මුද්‍රාව වවුචරයෙහි යොදා අධිකාරි බලය ලත් තැනැත්තා විසින් කෙටිසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වවුචර් 171 කින් කරන ලද රු.17,845,862 ක ගෙවීම් වෙනුවෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ ප්‍රමාද දෝෂය මඟහරවා විධිමත් ආකාරයෙන් අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව. | ගෙවීම් කිරීමේදී රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| iv. | මුදල් රෙගුලාසි 272(3) | රු.146,950 ක ගෙවීම්වලට අදාළ වවුචර් 8ක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අතපසුවීමකින් වවුචර් අස්ථානගත ව ඇත. ඉදිරියේදී එම අස්ථානගත වීම් සිදු නොවීමට වගබලා ගන්නා අතර, ඒ අනුව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවේක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. | |
| v. | මුදල් රෙගුලාසි 1646 | අම්බුළුවාව ජෛව විවිධත්ව මධ්‍යාස්ථානයේ වාහන 3ට අදාළව සමාලෝචිත වර්ෂයේ දෛනික ධාවන සටහන් මාසිකව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සංකීර්ණය තුළ පමණක් සීමිතව ධාවනය කළ හෙයින් ධාවන සටහන් භාවිතා කර නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් මාසිකව විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී රු.5,157,117 ක මුදලක් ගෙවා පෞද්ගලික සමාගමකින් වාහනයක් මිලදී ගෙන තිබූ අතර, ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර නොතිබුණි. | තක්සේරු වටිනාකමට අඩුවෙන් ලබා ගෙන ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු බව. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බුළුවාව ජෛව විවිධත්ව භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වන වගන්තියේ “අ” සිට “ත”දක්වා වූ අරමුණු 20 අතරින් පුද්ගලයින්ගේ ක්‍රීඩා සහ විනෝද කටයුතු පිළිබඳ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම, ගොවියන් ධෛර්යමත් කිරීම සහ ප්‍රජාව තුළ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම, අම්බුළුවාව කඳුපෙළ වටා ප්‍රදේශය වැඩි දියුණු කිරීම හා බුද්ධිමත්ව, බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල ආයෝජනයන් කිරීමට තැනැත්තන් උනන්දුකරවීම යන අරමුණු ඉටු කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | අරමුදලට ලැබෙන ආදායම් උපයෝගි කර ගනිමින් සංකීර්ණය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් යොදා ගනිමින් ඔවුනට සාධාරණ වැටුපක් ගෙවීම මත ඔවුන්ගේ පැවැත්ම සඳහා උපකාරී වීම, ජීවන තත්ත්වය උසස් කර ගැනීමට සහය වීම, ඉදිරි කාර්යයන් සඳහා විවිධ අංශයන් පිළිබඳ පුහුණු ශ්‍රමිකයන් පිරිසක් ඇති කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීම, සාමාජීය හා ආර්ථික ක්‍රියාකාරකම් තුළ යහපත් සහයෝගීතාවයන් ඇති කිරීම යනාදී කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති බව. | අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගත යුතු බව. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශෛලමය බුදු පිළිමය සැකසීම සඳහා රු.265,500 ක් වැයකර කළුගල් කඩා ඉවත් කර තිබුණද මිණුම්කර එම කළුගල් ඵලදායී කටයුත්තකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සිදු කරන ස්ථානයේ පිහිටීම අනුව කඩනු ලබන ගල් අසුරා තැබීමට නොහැකි අතර වෙඩි දැමීමට පෙර හා පසු කරනු ලබන මිනුම් අනුව ගෙවීම් කර ඇති බවත් වෙඩි පිපිරවීමේදි වැඩි ගල් ප්‍රමාණය පහතින් ඇති ප්‍රපාතයට ඇද වැටෙන බව. | කඩනු ලබන ගල් මිනුම් කර ඵලදායී කටයුත්තකට යොදවා ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බුළුවාව අරමුදල සතුව පවතින රු.5,400,000 ක පුස්තකාල ගොඩනැගිල්ල, රු.2,500,000 ක සංචාරක බංගලාව සහ වටිනාකම විගණනයට ඉදිරිපත් නොකළ රංග ශාලාව සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම වත්කම් උපයෝජනය කටයුතු කර ඇති අතර, තුන්වන පාර්ශවයකට රජයේ නියමයන්ට අනුව බදු දීමකට පියවර ගෙන ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව. |